## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ (පූර්ණ කාලීන - වැඩපැවරුම් පදනම මත)

**පූර්ණ කාලීන - වැඩපැවරුම් පදනම මත**

**1. විශේෂඥ වෛද්‍ය නිලධාරි – රසායනික ව්‍යාධිවේදී**

**සුදුසුකම්:**

I. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධාරියෙකු වීම.

හෝ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධාරියෙකු වීම.

සහ

III. වෛද්‍ය විශාරද උපාධිය (රසායනික ව්‍යාධිවේදය) විශේෂඥ (MD) (Doctor of Chemical Pathology) සමඟ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩල සහතිකය (Board Certification) ලබා තිබීම. (2014.10.11 දින නිකුත් කරන ලද 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ I වන ඇමුණුම).

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද “Certificate of Good Standing” ලබා තිබීම.

**වැටුප් පරිමාණය:**

MC 1-2 රු(91,645 - 12 × 2,700 - 124,045)
* විශේෂඥ වෛද්‍ය නිලධාරි MC 1-2 පියවර 01 හි තබනු ලැබේ. - රු.91,645.00

**පොදු කොන්දේසි:**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

5. විශේෂඥ වෛද්‍යවරුන් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨවල පීඨාධිපතිවරුන්ගේ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මඟ පෙන්වීම යටතේ එම පීඨවල සිසුන්ගේ ඉගැන්වීම් කටයුතු වලටද දායක විය යුතුය.

6. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2025.03.10** දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කල යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

7. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සතුවේ.

8. අසම්පූර්ණ සහ/හෝ ප්‍රමාද වී යොමු කරනු ලබන නියමිත ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. මෙම කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාල රෝහල වෙත බඳවා ගනු ලබන අතර විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නොවේ.

10. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න. www.kdu.ac.lk / දුරකථන අංකය – 0112044555.

**www.kdu.ac.lk**